# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/28 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 5/2011.

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වන සහ 14 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 89 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 16 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 1 දරන ජාතික මංමාවත් (කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද 2013 ඔක්තෝබර් 12 වන දින සහ අංක 1831/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් ප්‍රකාශිත "කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය" සම්බන්ධයෙන් අදාළ කරගත යුතු ය.

3. (1) ඉහත කී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ භාවිත කරන සෑම වාහනයකම රියදුරෙකුගෙන් ඒ මහා මාර්ගය එම රියදුරු විසින් භාවිත කිරීම සම්බන්ධයෙන් මෙම නියෝගවල උපලේඛනයේ "අ'' කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගාස්තුවක් අයකරගනු ලැබිය යුතු ය.

(2) ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් එම ගාස්තුව අයකරගනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගවල උපලේඛනයේ "අ'' කොටසේ නිශ්චිතව දක්වා ඇති විවිධ වර්ගවලට අයත් වාහනවලට විවිධ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

1A - PG 1800 — 750 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (1) යම් නම් කරන ලද ස්ථානයකින් හැර යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවිය යුතු මහා මාර්ගයට ප්‍රවේශවන සෑම වාහනයක රියදුරකුම, ඒ මහා මාර්ගයේ ගමන් කිරීමට අවසර ලබා දීමට ප්‍රථමයෙන් ඒ අන්තර් හුවමාරුවේ සේවයේ යෙදී සිටින අයකැමිගෙන් ප්‍රවේශ පත්‍රයක් ලබාගත යුතු ය; සහ

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ ගමන් කරමින් තිබෙන වාහනයක රියදුරකු විසින්, මහා මාර්ගයෙන් පිටව යෑමේ අරමුණ සඳහා ඒ රියදුරා විසින් පසුකර යා යුතු අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයකට පැමිණි විට,-

(අ) ඔහු අන්තර් හුවමාරුවෙන් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශවීමේ දී ලබා ගත් ප්‍රවේශ පත්‍රය අයකැමි යටතට පත්කල යුතු ය; හෝ

(ආ) ඔහු තමා ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූ නම් කරන ලද ස්ථානය අයකැමි වෙත සඳහන් කළ යුතු ය.

(3) අයකැමි විසින් ගෙවිය යුතු ගාස්තුව රියදුරු වෙත දැනුම් දිය යුතු වන අතර අන්තර් හුවමාරුවෙන් හෝ නම් කරන ලද ස්ථානයෙන් පිටවී යෑමට අවසර ලබාදීමට ප්‍රථමයෙන් ඒ මුදල රියදුරු විසින් ගෙවිය යුතු වන අතර අයකැමි විසින් ඒ ගෙවීම වෙනුවෙන් ලදු පතක් නිකුත් කළ යුතු ය.

5. (1) 4(1) වන නියෝගයේ සඳහන් කරන ලද ප්‍රවේශ පත්‍රයක් ලබාගත් සෑම රියදුරකුම එම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයෙන් පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයට ලඟා වන තෙක් එම ප්‍රවේශ පත්‍රය ඔහුගේ සන්තකයේ සුරක්ෂිතව තබාගත යුතු ය.

(2) (අ) ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී; හෝ

(ආ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූ ස්ථානය සඳහන් කිරීමට නොහැකි වූ අවස්ථාවකදී,

එම රියදුරු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණයම ගමන් කර ඇති අයකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය සඳහා ගාස්තු අයකරගනු ලැබිය යුතු ය.

6. (1) (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, එකී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය දිගේ අවශ්‍යකරන ස්ථානවල ප්‍රමාණවත් තරම් ගේට්ටු සංඛ්‍යාවක් සවිකර ඇති බවට සහතික විය යුතු ය.

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය දිගේ එසේ සවිකරන ලද ගේට්ටුවල අයිතිය, පාලනය සහ නඩත්තුව අධිකාරිය සතු වන අතර එක් එක් ගේට්ටුව අයකැමි විසින් හසුරුවනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයෙන් නියම කර ඇති පරිදි පිහිටුවා ඇති සෑම ගේට්ටුවක දී ම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් භාවිත කරන සෑම රියදුරකුගෙන්ම මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි භාවිත කිරීමේ ගාස්තු වශයෙන් යම් මුදලක් එකතු කර ගැනීම සඳහා අයකැමි වග කිව යුතු යඃ

එසේ වුවද, මෙම නියෝගවල උපලේඛනයේ "ආ" කොටසේ නිශ්චිතවම සඳහන් කර ඇති ගාස්තු ගෙවීමෙන් බැහැර කළ යුතු වර්ගයක වාහනයක් පදවන රියදුරකු වෙත මෙම නියෝගවල විධිවිධානයන් අදාළ නොවිය යුතු ය.

7. අයකැමි විසින්, නිශ්චිතව සඳහන් කර ඇති යම් වේලාවක දී දිනය තුළ එකතු කළ ගාස්තු අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත භාරදිය යුතු අතර ඒ මුදල සම්බන්ධයෙන් කුවිතාන්සියක් ලබාගත යුතු ය.

8. ගාස්තු ලෙස එසේ එකතු කරගත් මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග අදාළ වන ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සංවර්ධනය කර පවත්වාගෙන යාමේ කාර්ය සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල කාර්ය සඳහා -

"නම් කරන ලද ස්ථානය" යන්නෙන්, කටුනායක (කි.මී 25.8), කටුනායක අන්තර් හුවමාරුව, පෑලියගොඩ අන්තර් හුවමාරුව සහ නව කැළණිය අන්තර් හුවමාරුව ඇතුලුව යම් වාහනයක රියදුරකු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික

මහා මාර්ගයට ප්‍රවේශ පත්‍රයක් ලබා නොගෙන ප්‍රවේශ වීමට අවසර දෙනු ලබන, ප්‍රවේශවීමට බලය දෙන ලද ස්ථානයක් අදහස් වේ;

"අයකැමි" යන්නෙන්, අන්තර් හුවමාරුවක හෝ නම් කරන ලද ස්ථානයක ගේට්ටු හසුරවනු ලබන නිළධරයෙකු අදහස් වේ;

"ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය" යන්නෙන්, කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය අදහස් වේ.

10. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන වාහනයක රියදුරකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු -

(අ) පළමුවන වතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට; සහ

(ආ) දෙවන වතාවට හෝ ඊට වැඩි වාර ගණනකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතු ය.



**උපලේඛනය**

***අ කොටස***

(3 වන සහ 6 වන නියෝග)


*කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය*
*පළමුවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 කි.මී. 7.56 | | |
|---|---|---|---|
| | පැලියගොඩ | ජා-ඇල | කටුනායක |
| පැලියගොඩ | | | |
| ජා-ඇල | 200 | | |
| කටුනායක | 300 | 200 | |

| කාර් | |
|---|---|
|  | සියලුම කාර් |
|  | සියලුම ජීප් |
|  | සියලු සැලූන් ස්ටේෂන් වැගන් |
| ද්විත්ව කාර්ය වාහන | |
|  | සියලුම කැබ් රථ (තනි හා ද්විත්ව) |
|  | ආසන 9ක් දක්වා වූ සියලු මගී වෑන් රථ |
|  | දළ බර කිලෝ ග්‍රෑම් 3500 දක්වා වූ බඩු ප්‍රවාහන වෑන් සහ ට්‍රක් රථ |
| සැහැල්ලු මෝටර් ලොරි | |
|  | ඇක්සල් 2ක් සහ රෝද 4ක් සහිත ලොරි සහ ට්‍රක් රථ |



*දෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 කි.මී. 7.56 | | |
|---|---|---|---|
| | පෑලියගොඩ | ජා-ඇල | කටුනායක |
| පෑලියගොඩ | | | |
| ජා-ඇල | 350 | | |
| කටුනායක | 450 | 300 | |

| සැහැල්ලු මෝටර් කෝච් | |
|---|---|
|  | ආසන 9ට වැඩි මගී ප්‍රවාහන වෑන් රථ |
|  | ආසන 9ත් 33ත් අතර සියලු බස් රථ |

*තෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 කි.මී. 7.56 | | |
|---|---|---|---|
| | පෑලියගොඩ | ජා-ඇල | කටුනායක |
| පෑලියගොඩ | | | |
| ජා-ඇල | 400 | | |
| කටුනායක | 600 | 300 | |

| මෝටර් කෝච් | |
|---|---|
|  | ආසන 33ට වැඩි සියලු බස් රථ |
| සැහැල්ලු මෝටර් ලොරි | |
|  | ඇක්සල් 2ක් සහ රෝද 6ක් සහිත ලොරි සහ ට්‍රක් රථ |
| මෝටර් ලොරි | |
|  | ඇක්සල් 3ක් සහිත මෝටර් ලොරි සහ ට්‍රක් රථ (දළ බර කිලෝ ග්‍රෑම් 17000ට වැඩි) |

*සිව්වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 | කි.මී. 7.56 | |
|---|---|---|---|
| | පැලියගොඩ | ජා-ඇල | කටුනායක |
| පැලියගොඩ | | | |
| ජා-ඇල | 600 | | |
| කටුනායක | 800 | 300 | |

| | |
|---|---|
| බර මෝටර් කෝච් | |
|  | එකට ඈඳූ මෝටර් කෝච් දෙකක් සහිත බස් |
| බර මෝටර් ලොරි | |
|  | ඇක්සල් 4ක් හෝ ඊට වැඩි සියලු රථ |

*ආ කොටස*

(6 වන නියෝගය)

**කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය භාවිත කරන්නන් සඳහා වූ ගාස්තු ගෙවීමෙන් බැහැර කර ඇති වාහන**

1. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන ජනාධිපති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලුවාහන.

2. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන අගමැති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලුවාහන.

11-149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.